*සැ. යු.*– 2006.04.12 දින අංක 1,441 දරන *ගැසට් පත්‍රයේ* I : II (අ) සහ IV(අ) කොටස පළ නොකරන ලදී.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,442 — 2006 අප්‍රේල් 21 වැනි සිකුරාදා — 2006.04.21**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | 466 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 469 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 අප්‍රේල් මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය – අනුරාධපුර

### මහෝපාධ්‍යාය ධූරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුව බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යාය ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

01. පිළිගත් විශ්වවිද්‍යාලයක බෞද්ධ අධ්‍යයනය පිළිබඳව පශ්චාත් උපාධියක් ලබා තිබීම ;

02. ප්‍රාචීන භාෂා පිළිබඳ හසල දැනුමක් ලබා තිබීම ;

03. උපසම්පදාව ලැබීමෙන් පසු වසර 20ක් සම්පූර්ණ කර තිබීම හා විනයධර භික්ෂූන් වහන්සේ නමක්වීම.

මහෝපාධ්‍යායයන් වහන්සේ වර්ෂ 03ක කාලයකට පත් කරනු ලබන අතර, උන්වහන්සේ විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධාරියෙකු ද, ප්‍රධාන විධායක හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධාරියා ද වන්නේ ය. විශ්ව විද්‍යාලය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව මහෝපාධ්‍යායයන් වහන්සේ වගකිව යුතුය. විශ්ව විද්‍යාලයේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පාලක සභාව විසින් ගනු ලබන තීරණ ද, අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් සනාතන සභාව විසින් ගනු ලබන තීරණ ද, ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම උන්වහන්සේගේ වගකීම වන්නේ ය. 2006.07.07 වන දිනට වයස අවුරුදු 62 කට නොවැඩි විය යුතු ය. මහෝපාධ්‍යායයන් වහන්සේ වර්ෂ තුනක කාල සීමාවකට හෝ හැටපස් (65) වන විය හෝ සම්පූර්ණ කිරීම යන දෙකින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධූරය දැරිය හැකි ය.

මහෝපාධ්‍යායයන් වහන්සේට රජය විසින් අනුමත කර ඇති වැටුප් හා අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. අයදුම්කාර භික්ෂූන් වහන්සේ විශ්වවිද්‍යාල පද්ධතියේ /රජයේ සේවයේ/ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු වන්නේ නම්, සිය ආයතන ප්‍රධානියා මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, මෙම ධූරයට තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළහැකි බව අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළයුතුය. මෙම වගන්තිය බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ භික්ෂූන් වහන්සේලාට අදාළ නොවේ. විශ්වවිද්‍යාලය තුළ නේවාසික පහසුකම් සපයනු ලැබේ.

මහෝපාධ්‍යාය තනතුරට පත් වූ විට ඉදිරි වර්ෂ 03ක කාලය තුළ දී විශ්ව විද්‍යාලය සඳහා සිදු කිරීමට බලාපොරොත්තු වන මෙහෙවර දක්වන ලිපියක් සමඟ සවිස්තර ජීවදත්ත දැක්වෙන ඉල්ලුම්පතක් පිළියෙල කොට ලේඛකාධිකාරී/පාලක සභාවේ ලේකම්, බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය, නන්දන මාවත, අනුරාධපුර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2006.05.05 දින හෝ ඊට පෙර එවිය යුතු ය. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මහෝපාධ්‍යාය ධූරය" සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය.

ලේඛකාධිකාරී/ පාලක සභාවේ ලේකම්.

2006 අප්‍රේල් මස 04 වැනි දින,
බුද්ධශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලය,
නන්දන මාවත,
අනුරාධපුර.

04–301

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරී තනතුර

### ආරක්ෂක උපාධිය සමඟ අධිකාරිය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරී තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේදී පුහුණු කරවනු ලැබේ.

2. පුහුණුවීමේ කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව කෙඩෙට් නිලධාරීන් සබරගමුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන ආරක්ෂක උපාධිය සමඟ දෙවන ලුතිනන් නිලයේ අධිකාරියට පත් කරනු ලැබේ.

3. *යෝග්‍යතාවය.–* අයදුම්කරුවන් –

(අ) ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

(ආ) 2006 මැයි 31 වැනි දිනට වයස අවුරුදු 18 නොඅඩුවද 22ට නොවැඩිවද විය යුතුය.

(ඇ) අ. පො. ස. (උ/පෙළ) නව නිර්දේශය විභාගයෙන් විෂයයන් 03ක් සමත්ව අවම වශයෙන් මුළු ලකුණු 135ක් ලබා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබ තිබිය යුතු අතර, අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් හා ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඈ) අයදුම්කරුවන් අවිවාහකයන් විය යුතුය. පුහුණුවීම ලබන කාලය තුළදී කෙඩෙට් නිලධාරියෙකුට විවාහවීමට අවසර දෙනු නොලැබේ.

(ඉ) අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වයෙහි සිටිය යුතුවේ. අවසාන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පිළියෙළ කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

4. *සේවා කොන්දේසි* :

(අ) තෝරාගනු ලබන අපේක්ෂකයින් කෙඩෙට් නිලධාරීන් වශයෙන් නිත්‍ය සේවයේ අවුරුදු 10ක කාලසීමාවකට බඳවාගනු ලැබේ.

(ආ) පුහුණුවීම් ලබන කාලසීමාව තුළදී කෙඩෙට් නිලධාරියෙකුගේ වාර්ෂික වැටුප යුද්ධ හමුදා වැටුප් සංග්‍රහයන් අනුව වන අතර එය රු. 1,15,320කි. ප්‍රවාහන, නිල ඇඳුම්, වෛද්‍ය, ආහාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ. කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් සේවය කරන කාලය තුළදී ඔහුට කිසිම වැටුප් වැඩිවීමකට හිමිකම් නොමැත.

(ඇ) යුද්ධ හමුදාධිපති විසින් නියම කරන අන්දමේ පුහුණුවීම්වල නිරතවීම් කෙඩෙට් නිලධාරීන්ට අවශ්‍ය වේ. පුහුණුවීමේ කාලසීමාව මාස 30ක් පමණ වේ.

(ඈ) පුහුණුවීමේ කාලය තුළදී කෙඩෙට් නිලධාරීන්ගේ තරාතිරම සෙසු නිලයන් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට යටත් වනු ඇත.

(ඉ) (1) පුහුණුවීමේ කාලසීමාව තුළදී කෙඩෙට් නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය හමාර කළහොත් එතෙක් එම කෙඩෙට් නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුනු සියලුම වියහියදම් දෙමව්පියන් හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුය.

(2) කෙඩෙට් නිලධාරියෙක් පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුල කිනම් අවස්ථාවක වුවත්, විෂමාචාර හේතූන් නිසා හෝ තමන් විසින් වළක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරය පිරිනැමීමට නුසුදුසුයැයි නිලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට යෙදුනු සියළුම වියහියදම් දෙමව්පියන් හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුය.

(ඊ) අධිකාරියට පත් කිරීමේදී කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් නිත්‍ය බල හමුදාවට ඇතුළත් වූ බැඳීමෙන් කෙඩෙට් නිලධාරීන් මුදවා හරිනු ලැබේ.

(උ) නිලධාරීන් වශයෙන් අධිකාරියට පත් කිරීමෙන් පසුව අඩු වශයෙන් අවුරුදු 10ක් යුද්ධ හමුදාවේ සේවය කළ යුතුවේ.

(ඌ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ නිලධාරීන් වශයෙන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙහි අධිකාරයට පත් කරනු ලැබීමේදී ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන්ට අදාළ වන පහත දැක්වෙන වැටුප් ක්‍රමයෙහි තබනු ලැබේ:

| | | |
|---|---|---|
| දෙවන ලුතිනන් | – | රු. 1,24,680 වාර්ෂිකව<br>රු. 10,390 මාසික |
| ලුතිනන් | – | රු. 1,57,500 - 9 x 3,780 = රු. 1,91,520 වාර්ෂිකව<br>රු. 13,125 - 9 x 315 = රු. 15,960 මාසික |
| කපිතන් | – | රු. 1,80,180 - 9 x 3,780 = රු. 2,14,200 වාර්ෂිකව<br>රු. 15,015 - 9 x 315 = රු. 17,850 මාසිකව |
| මේජර් | – | රු. 2,02,860 - 7 x 3,780 - 1 x 4,200 - 2 x 6,300 = රු. 2,46,120 වාර්ෂිකව<br>රු. 16,905 - 7 x 315 - 1 x 350 - 2 x 525 = රු. 20,510 මාසිකව |
| ලුතිනන් කර්නල් | – | රු. 2,14,980 - 2 x 7,740 - 5 x 8,580 = රු. 2,73,360 වාර්ෂිකව<br>රු. 17,915 - 2 x 645 - 5 x 715 = රු. 22,780 මාසික |
| කර්නල් | – | රු. 2,76,540 - 7 x 11,880 - රු. 3,59,700 වාර්ෂිකව<br>රු. 23,045 - 7 x 990 = රු. 29,975 මාසිකව |
| බ්‍රිගේඩියර් | – | රු. 3,00,300 - 8 x 11,880 = රු. 3,95,340 වාර්ෂිකව<br>රු. 25,025 - 8 x 990 - රු. 32,945 මාසිකව |
| මේජර් ජෙනරාල් | – | රු. 3,45,600 - 6 x 12,360 = රු. 4,19,760 වාර්ෂිකව<br>රු. 28,800 - 6 x 1,030 = රු. 34,980 මාසිකව |
| ලුතිනන් ජෙනරාල් | – | රු. 3,70,320 - 5 x 12,360 = රු. 4,32,120 වාර්ෂිකව<br>රු. 30,860 - 5 x 1,030 = රු. 36,010 මාසිකව |

(එ) වැටුප් මතු බලාරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි වලින් නිලධාරීන්ට බලපවත්වනු ලැබේ :

(1) යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

(2) 1993 අගෝස්තු මස 17 වැනි දින අංක 780/7 දරන *ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරීන්ගේ රෙගුලාසි.

(3) 1981 යුද්ධ හුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

5. මෙහි පහත 6 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශ පත්‍රයට අත්සන් කළ යුතු වන අතර, එය අයදුම්පත්‍රයත් සමග ඉදිරිපත් කළ යුතුවේ. අපේක්ෂකයන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත්කිරීමට පෙර ප්‍රකාශ පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමඟ ඇපකරයකට අත්සන් කළ යුතුය.

6. *අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරි ඉල්ලුම්කරුවෙකු වන ………… ගේ පියා, මව, භාරකරු මම වෙමි.

(ආ) ශ්‍රී ලංකාවේ පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත්, මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි :

(1) පුහුණුවීමේ කාලසීමාව තුළදී අයදුම්කරු හට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට ;

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන්ම අධිකාරය සඳහා වූ තම අපේක්ෂකත්වය හමාර කළහොත්, ඔහු වෙනුවෙන් දරන්නට වූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට ;

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින්ම වලක්වාලිය හැකි හේතූන් හෝ නිසා) අධිකාරය ලැබීමට නුසුදුසු යැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට වූ සියලුම වියහියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමටද වේ.

*නොයෙදෙන වචනය කපා හරින්න.

______________,

අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :——————.
දිනය :—————.
සාක්ෂිකරුගේ අත්සන :—————.
නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :—————.

7. *භාෂා අවශ්‍යතා.*– ශ්‍රී ලංකා ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති රෙගුලාසි මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියා කළ යුතු වේ.

8. *අනන්‍යතාවය ඔප්පු කිරීම.*– අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍යවනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත්‍ර, රථවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වාහන පැදවීමේ බලපත්‍රය හෝ ආගමන හා විගමන පාලක දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍රය පිළිගනු ලැබේ.

9. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත්‍ර, අපේක්ෂකයා තෝරාගතහොත් මුදාලිය හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් එවිය යුතුය.

10. *ඉල්ලුම් පත්‍ර.-* ඉල්ලුම්පත්‍ර පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්කරුගේම අත් අකුරින් ලියා 2006 මැයි මස 15 දින දහවල් 12 ට හෝ ඊට පෙර ලැබෙනසේ "පිරිස් පරිපාලන අධ්‍යක්ෂ, පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ" යන ලිපිනයට එවිය යුතුවේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් උඩ කෙළවරේ "යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුවේ. ඉල්ලුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනයට හා වේලාවට පසුව මෙම මූලස්ථානයට ලැබෙන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍ර නිකුත් කරනු නොලැබේ.

11. ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතික වල පිටපත් එවිය යුතුය :–

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම සනාථ කිරීමේ සහතිකය.

(ඇ) අයදුම්කරුවා පුද්ගලිකව දන්නා හඳුනන වගකිවයුතු පුද්ගලයින්ගෙන් මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික යටත් පිරිසෙයින් දෙකක්. මින් එක් සහතිකයක් අයදුම්කරු අවසාන වරට ඉගෙනීම ලැබූ පාසැලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතුවේ.

12. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේ ය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

13. තේරීම් මණ්ඩල මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව හා දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පවත්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනයම් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ගෙවනු නොලැබේ.

14. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

15. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන් වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කරුවන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම් භාර ගනු නොලැබේ.

ජීඑස්සී ෆොන්සේකා ආර්ඩබ්පී ආර්එස්පී ආර්සීඩීඑස් පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

යුද්ධ හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ.
2006 අප්‍රේල් මස 05 දින.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. (අ) මුල් නම (පැහැදිලි අකුරෙන්) :————.
(ආ) අනෙකුත් නම් :————.
(ඇ) මුලකුරු සමග නම

2. (අ) ලිපිනය :————.
(ආ) දුරකථන අංකය :————.
(ඇ) මැතිවරණ කොට්ඨාශය සහ එහි අංකය :————.
(ඈ) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.

3. පුරවැසි භාවය (ලාංකික වනුයේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් දැයි දක්වා ලියාපදිංචි වීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න) :————.

4. (අ) උපන් දිනය (උප්පැන්න සහතිකයකින් සනාථ කළ යුතුය. බෞතිස්ම සහතිකය හෝ අධ්‍යාපන සංග්‍රහය යටතේ නිකුත් කරනු ලබන සහතිකය පිළිගනු නොලැබේ)

(ආ) 2006.05.31 වැනි දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

(ඇ) උස :————.

5. ආසන්නම පොලිස් ස්ථානය :————.

6. පියාගේ නම සහ උත්පත්තියේ දී ජාතිය (පුරවැසි බව ලැබූවෙකු නම් සහතිකයේ දිනය හා අංකය සඳහන් කරන්න) :————.

7. මවගේ නම සහ උත්පත්තියේදී ජාතිය :————.

8. ඔබේ පාසැල් සමයේ පහත සඳහන් විස්තර සපයන්න :————.

| *පාසැලේ නම* | *ඇතුළත් වූ දිනය* | *අස් වූ දිනය* | *අවසානයට පෙනී සිටි විභාගය* |
|---|---|---|---|
| | | | |

9. අධ්‍යාපනික සුදුසුකම් (එක් එක් විභාගයන් වෙන් වෙන්ව දක්වා සිටිය යුතුය) :

| *විභාගය සහ විභාග අංකය* | *වර්ෂය* | *සමත් විෂයයන්* | *සාමාර්ථ වර්ග කිරීම* |
|---|---|---|---|
| | | | |

10. ඔබ පාසැලේ දී ලැබූ ක්‍රීඩා පිළිබඳ විශිෂ්ටතාවයන් :————.

11. ඔබ විසින් පාසැලේදී ලැබූ වෙනත් සැළකිලිමත් ජයග්‍රහණ :————.

12. ජාතික ශිෂ්‍යභට බලකායේ, බාල දක්ෂ ව්‍යාපාර, ශ්‍රී ලංකා ස්වෙච්ඡා සංවිධානවල කළ සේවය :————.

13. කිසියම් සන්නද්ධ සේවයකට කලින් ඉල්ලුම්කර ඇත්නම් එහි ප්‍රතිඵලය දක්වන්න :————.

14. පාසලෙන් අස් වූ තැන් පටන් කළ රැකියාව :————.

15. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයේ මණ්ඩලයක/සංස්ථාවක (මධ්‍යම බැංකුව, ජනසතු කළ බැංකු, වාණිජ බැංකු, විශ්ව විද්‍යාල, රජය මගින් පාලනය කරනු ලබන හවුල් ව්‍යාපාර සමාගම් යනාදිය) සේවය කර ඇත්නම් එම සේවය අවසන් කිරීමට හේතු :————.

16. චරිත සහතික දුන් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකයන් :————.

17. වෙනත් අදාළ කරුණු :————.

ඉහත දැක්වෙන ප්‍රකාශයන්ට මවිසින් සපයන ලද පිළිතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය බැව් ගෞරව පූර්වකව ප්‍රකාශ කර සිටිමි. යුද්ධ හමුදා කෙඩෙට් නිලධාරි තනතුරු සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට බලපාන සේවා කොන්දේසි මෙන්ම නිලධාරීන්ට බලපාන වැටුප් මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි *ගැසට් පත්‍රයෙහි* ප්‍රසිද්ධ කර ඇති පරිදි මවිසින් කියවා ඇති අතර එය මම අවබෝධ කර ගතිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

04-338

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය – 2006

බලයලත් සැළසුම් ශිල්පීයෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වේයර් ජනරාල්ගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

(i) *වැනි කොටස* – බණ්ඩාංග පත්‍ර පිළියෙළ කිරීම

(ii) *වැනි කොටස* - පිඹුරු ඇඳීම

2. විභාගයේ පළමුවැනි කොටස 2006 ජූලි මස 08 වැනි දිනද, දෙවෙනි කොටස 2006 සැප්තැම්බර් මස 09 හා 10 යන දිනයන්හි දී ද පැවැත්වෙනු ඇත. පළමු වැනි කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට දෙවෙනි කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන්ම එකවර සමත් වන අපේක්ෂයින්, බලයලත් සැළසුම් ශිල්පීන් සඳහා වන සර්වේයර් ජනරාල්ගේ සහතිකය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේ දී, අපේක්ෂකයින්ට පහත සඳහන් දෑ කළ හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතුය.

*(අ)* ක්ෂේත්‍ර සටහන් මගින් බණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් බණ්ඩාංක කිරීමට,

*(ආ)* කෝණමානය භාවිතයෙන් හා බණ්ඩාංග ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට හා ක්ෂේත්‍රඵලය ගණනය කිරීමට.

4. පහත දැක්වෙන ආදර්ශය අනුව පිළියෙල කර ගත් අයදුම්පත්‍ර රු. 300.00 ක් වටිනා මුදල් ඇණවුමක් හෝ දියතලාව, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවා ලබා ගත් රිසිට් පතක් සමඟ මිනින්දෝරු අධිකාරී (විභාග), මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය, දියතලාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මුදල් ඇණවුමේ ගෙවීම් ලබන්නා "අධ්‍යක්ෂ, මැණුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය" ලෙසද, ගෙවන කාර්යාලය, "දියතලාව" ලෙසින් ද සඳහන් කළ යුතුය. එසේම රිසිට්පතේ මුල්පිටපත හෝ මුදල් ඇණවුමේ මුල් පිටපත අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුය. (කරුණාකර රිසිට් පත හෝ මුදල් ඇණවුම් අයදුම්පත්‍රයේ අලවා නොඑවන්න.) කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ "බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේ ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය – 2006" යනුවෙන් සඳහන් කරන්න. මුද්දර මගින් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.

5. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

6. අයදුම්පත් 2006 ජූනි මස 05 දින හෝ ඊට පෙර එවිය යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.

7. බණ්ඩාංක පත්‍ර හා ඇඳීම් කඩදාසි විභාග ශාලාවේදී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් විසින් ඇඳීම් උපකරණ ද, බණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු යනාදිය ද, අවශ්‍ය අනෙකුත් සියළු උපකරණ ද රැගෙන ආ යුතුය. විභාගශාලාධිපතිගේ අවසර ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

8. (i) සෑම විභාග අපේක්ෂකයෙකුම විභාගශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකිය .

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත,

*(ආ)* වලංගු ගමන් බල පත්‍රයක්,

*(ඇ)* විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්.

(ii) ඉහත 8 (i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

බී. ජේ. පී. මෙන්ඩිස්,
සර්වේයර් ජනරාල්

2006 මාර්තු මස 01 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ.පෙ. 506,
කොළඹ 05.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව*

බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය – 2006

විභාග අංකය [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අ) (i) මුලකුරු සමඟ නම :————. මයා /මිය/ මෙනවිය.
(ii) මුලකුරු වලින් හැඳිනවෙන නම් :————.
(iii) මුලකුරු සමඟ නම පැහැදිලිව ඉංග්‍රීසියෙන් :————.

(ආ) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

(ඇ) තනතුර :————.

(ඈ) රැකියා ස්ථානයේ ලිපිනය :————.

(ඉ) ස්ථිර ලිපිනය :————.

(ඊ) උපන් දිනය :————.

(උ) අධ්‍යාපන සුදුසුකම් :————.

(ඌ) විභාගයට පෙනී සිටින මාධ්‍ය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි):————.

(එ) ගෙවන ලද ගාස්තු :————.

(ඒ) මුදල් ඇණවුම් / රිසිට්පත් අංකය :————.
නිකුත් කළ කාර්යාලය:————.
දිනය :————.

(ඔබ විසින් දියතලාව, මැණුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවන ලද්දේ නම් එම රිසිට් පත හෝ මුදල් ඇණවුමක් මගින් එවන්නේ නම් එම මුදල් ඇණවුමේ මුල් පිටපත හෝ අමුණා එවිය යුතුය.)

මවිසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි හා සත්‍ය තොරතුරු බව සහතික කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

04 – 242

**කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**බිම් මැනීම හා තලමිතිය පිළිබඳ සර්වේයර් ජනරාල්ගේ බලපත්‍රය නිකුත් කිරීම සඳහා වන වාර්ෂික විභාගය – 2006**

බිම් මැණීම හා තලමිතිය පිළිබඳ සර්වේයර් ජනරාල්ගේ බලපත්‍රය ප්‍රදානය කිරීමේ ඉහත සඳහන් වාර්ෂික විභාගය, ලිඛිත හා ප්‍රයෝගික වශයෙන් කොටස් දෙකකින් යුක්තව පවත්වනු ලැබේ.

ලිඛිත විභාගය 2006 ජූනි මස 17 දින ආරම්භ වන අතර, ප්‍රායෝගික පරීක්ෂණ 2006 අගෝස්තු 15 වැනි දින ආරම්භ වේ. ලිඛිත විභාගයෙන් සමත් වූ හෝ එයින් නිදහස් කර ඇති අපේක්ෂකයින්ට පමණක් ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

2. ලිඛිත විභාගය කොළඹ දී ද, ප්‍රායෝගික පරීක්ෂණය දියතලාව, මැණුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ දී හෝ කොළඹ දී පැවැත්වෙනු ඇත.

2002.10.04 දිනැති අංක 17 දරන මැනුම් පනතේ 25(2) (ආ) (iv) ඡේදය අනුව මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර දෙනු ලබන්නේ මැණුම් පනත ආරම්භ වීමට පෙරාතුව අවම වශයෙන් එක් වතාවක්වත් මෙම විභාගය සඳහා පෙනී සිටිනු ලැබ ඇති අපේක්ෂකයින්ට පමණය. අළුතින් ඉදිරිපත්වන අපේක්ෂකයින්ට විභාගය සඳහා පෙනීසිටීමට ඉඩ නොදෙනු ඇත.

තවද වසර 2007 න් පසු මෙම විභාගය සර්වේයර් ජනරාල් විසින් නොපවත්වනු ඇත.

3. (අ) විභාගයට ඇතුළත්වීම සඳහා, කොළඹ 05, සර්වේයර් ජනරාල් කාර්යාලයේ මූලස්ථාන අංශයෙන් හෝ දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ, විභාග අංශයෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍ර සම්පූර්ණ කර 2006 මැයි 25 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන්, "මිනින්දෝරු අධිකාරී, විභාග අංශය, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය, දියතලාව" යන ලිපිනයට එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ, "සර්වේයර් ජනරාල්ගේ බලපත්‍රය නිකුත් කිරීම සඳහා වන වාර්ෂික විභාගය" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ආ) පහත සඳහන් සහතික වල පිටපත් අයදුම්පත්වලට අමුණා එවිය යුතුය.

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර (ඉංග්‍රීසි) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, ඉංග්‍රීසි භාෂාව, සිංහල/ දෙමළ භාෂාව යන විෂයයන් ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත්ව තිබීම හෝ වෙනත් උසස් විභාගයක් ;

(ii) යටත් පිරිසෙයින් අවුරුදු එකක කාලයක් තුළ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ යථා පරිදි බලපත්‍ර ලත් මිනින්දෝරුවෙක්, තලමිතිකරුවෙක් හෝ මිනින්දෝරුවෙක් සහ තලමිතිකරුවෙක් යටතේ මිනින්දෝරු සහ තලමිතිකරුවෙක් යටතේ අයදුම්කරු බිම් මැනීම හෝ තලමිතිය *නැතහොත්* බිම් මැනීම සහ තලමිතිය අධ්‍යයනය කළ බව පෙන්වීමට සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

*සටහන.*–සහතිකවල මුල් පිටපත් පසුව ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

4. අයදුම්පත් භාර ගැනීම අවසාන වන දිනට, එනම් 2006 මැයි 25 වැනි දිනට ප්‍රථමයෙන් අයදුම්කරුවන් පහත සඳහන් පරිදි විභාග ගාස්තු සර්වේයර් ජනරාල්ට ගෙවිය යුතු ය.

| | රු. ශ. |
|---|---|
| (i) ලිඛිත විභාගය | |
| ඇතුළත්වීමේ ගාස්තු | 75 0 |
| ඉංග්‍රීසි භාෂාව, අංක ගණිතය හා වීජ ගණිතය, ජ්‍යාමිතිය හා ත්‍රිකෝණමිතිය යන විෂයයන් සඳහා බිම් මැනීම විෂයය සඳහා | 150 0 |
| බිම් මැනීම විෂයය සඳහා | 75 0 |
| තලමිතිය විෂයය සඳහා | 75 0 |
| (ii) ප්‍රායෝගික පරීක්ෂණය | |
| ඇතුළත්වීමේ ගාස්තු | 75 0 |
| බිම් මැනීම සඳහා | 525 0 |
| තලමිතිය සඳහා | 525 0 |

මුදල් ඇණවුමක් මගින් විභාග ගාස්තු ගෙවිය හැක. නොඑසේ නම්, කොළඹ 5, සර්වේයර් ජනරාල් කාර්යාලයට හෝ දියතලාව, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවා ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කළ හැකිය. මුදල් ඇණවුමක් මගින් ගෙවන්නේ නම් මුදල් ඇණවුමේ ගෙවීම් ලබන්න. "අධ්‍යක්ෂ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය" ලෙසද, ගෙවන කාර්යාලය "දියතලාව" ලෙසින් ද සඳහන් කළ යුතුය.

ඔබ විසින් මුදල් කොළඹ 5, සර්වේ ජනරාල් කාර්යාලයට හෝ දියතලාව, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයට ගෙවන ලද්දේ නම් එම රිසිට් පත හෝ මුදල් ඇණවුමක් මගින් එවන්නේ නම් එම මුදල් ඇණවුමේ මුල් පිටපත හෝ අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුය. (ඔබ විසින් රිසිට් පත හෝ මුදල් ඇණවුම් අයදුම් පත්‍රයට අලවා නොඑවිය යුතුය).

මුද්දර මගින් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.

*සටහන.–* ලිඛිත විභාගයෙන් මෙතෙක් සමත් නොවූ අපේක්ෂකයින් මේ වර්ෂයේ දී ලිඛිත පරීක්ෂණයට පෙනී සිට ඉන් සමත් වීමෙන් පසුව ප්‍රායෝගීක පරීක්ෂණය සඳහා ඉහත 4 (ii) ගාස්තු ප්‍රාදේශීය පරීක්ෂණ පැවැත්වෙන දිනට ප්‍රථම ගෙවා ඇතුළත් විය හැකි ය. (3 වැනි ඡේදය බලන්න.)

5. ලිඛිත පරීක්ෂණයට අයත් විෂයයන් පහත සඳහන් පරිදි වෙත්.–

(i) *ඉංග්‍රීසි භාෂාව –* පත්‍ර එකයි

රචනයක් පිළිබඳ අභ්‍යාසයක් හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අයදුම්කරුගේ දැනීම පරීක්ෂා කිරීමට ප්‍රශ්න.

(ii) *අංක ගණිතය හා වීජ ගණිතය-* පත්‍ර එකයි

*අංක ගණිතය :–* පූර්ණ සංඛ්‍යා, සාමාන්‍ය භාග, දශම භාග, යන මේවා සඳහා අංක ගණිතයේ මූලධර්ම, ක්‍රියාවලින් යෙදීම, මෙට්‍රික් ක්‍රමය, සඳහන් කළ නිරවද්‍යතාවයනට සන්නිකරණය, දශම ගුණ කිරීමේ හා බෙදීමේ කෙටි ක්‍රමය, අනුපාත හා සමානුපාත, ප්‍රතිශත, සාමාන්‍ය ගණන්, අංක ගණිතයේ ප්‍රායෝගික භාවිත.

*වීජ ගණිතය.–* සාමාන්‍ය, අංක ගණිතමය ප්‍රතිඵල සංකේත මගින් ප්‍රකාශ කිරීම, වීජ ගණිත නියම හා ඒවායේ භාවිත, සරල ද්වීපද හෝ වර්ග ප්‍රකාශවල සාධක, පළමු බලයේ හෝ දෙවැනි බලයේ හෝ සමීකරණ හා ඒ සම්බන්ධ ගැටළු, වර්ග මූල, සරල පරිමේය, පූර්ණ සංඛ්‍යාත්මක වීජ ශ්‍රිත වලට අදාළ ප්‍රස්ථාර, සාමාන්තර හා හරාත්මක ශ්‍රේණි, ගුණෝත්තර ශ්‍රේණි, දර්ශකවාදය, ලඝුගණක හා ලඝුගණක වක්‍ර භාවිතය, ධන පූර්ණ සංඛ්‍යාත්මක දර්ශකයන් සඳහා ද්වීපාද ප්‍රමේයය,

(iii) *ජ්‍යාමිතිය හා ත්‍රිකෝණමිතිය –*පත්‍ර එකයි

*ජ්‍යාමිතිය.–* ඉයුක්ලීඩ් කාණ්ඩ i - iv දක්වා කරුණු හා ඒවායේ සරල නිගමන හා පහසු පථද, මැනිය හැකි දිගින් යුතු ආධාරක හා උසින් යුතු ත්‍රිකෝණවලත් සමාන්තරාශ්‍ර වලත් වර්ග ඵලද, මීට ඇතුළත් ය. (ජ්‍යාමිතිය ප්‍රමේයවල ඔප්පු කිරීමේ සියල්ල ජ්‍යාමිතික විය යුතුය. ඉයුක්ලීඩ්ගේ ඔප්පු කිරීම අවශ්‍ය නොවේ.) සමරූපි රූප, වෘතයේ මිනිතය, ඝනකය, ඍජුකෝණාශ්‍රාකාර කුට්ටිය, චතුස්තලය, ගෝලය, සිලින්ඩරය, කුඤ්ඤය, පිරමීඩය, කේතුව, යන සරල වස්තුවල මිනිතය.

(iv) *බිම් මැනීම –*පත්‍ර එකයි.

දම්වැල් මැනුම, සංක්‍රාන්ති හා දෝලන තියොඩලයිටයන්, ඒවායේ පාවිච්චිය හා සීරු මාරු කිරීම, සමතල ඍජුකෝණාස්‍ර ඛණ්ඩාංක භාවිතය ඇතුළු තියොඩලයිට්ටු සහ මාලිමා පරික්‍රමණ, වක්‍ර පිහිටුවීම, ආපාතික ක්‍රම හා ආංශුමිතිය, තලමේස මැනුම්, සමතල ත්‍රිකෝණීකරණය, නක්ෂත්‍ර නිරීක්ෂණ මගින් උද්දිගාංශය නිර්නය කිරීම.

(v) *තලමිතිය –*පත්‍ර එකයි.

ඩම්පි, වයි ( Y) සහ කුක්ගේ ප්‍රතිවර්ත්‍ය ලෙවලයන්, ඒවායේ පාවිච්චිය හා සීරු මාරුකිරීම, මට්ටම් ගැනීම පිළිබඳ අභ්‍යාස හා සිද්ධාන්ත, පස් වැඩ ගණනය කිරීම, පාරවල් හා දුම්රිය මාර්ග පිළිබඳ මැනුම්,ජල සැපයුම මාර්ග බිම පිහිටුවීමේ මැනුම්, සමෝච්චිත රේඛා සහ ඒවා අතර අඩංගු ප්‍රමාණ ගණනය කිරීම.

(ii) – (v) දක්වා වූ ඉහත ප්‍රශ්නපත්‍ර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන් ගෙන් පිළියෙල කෙරේ. අපේක්ෂකයින්ට තමන් කැමති එක් මාධ්‍යයකින් පිළිතුරු ලිවිය හැකි ය.

6. ලිඛිත විභාගයේ දී (i), (ii), සහ (iii) යන ප්‍රශ්න පත්‍රවලින් සාමාර්ථයක් ලැබීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 40% බැගින් ද, ඉහත ප්‍රශ්න පත්‍ර තුනේම සාමාන්‍ය ලකුණු 50%ක් ද ලබා තිබිය යුතුය. (iv) සහ (v) යන ප්‍රශ්න පත්‍රයන්ගෙන් සාමාර්ථයක් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 60% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා තිබිය යුතුය.

7. බිම් මැනීමට පමණක් පෙනී සිටින අයදුම්කරුවන් විසින් ඉහත සඳහන් (i) සහ (iv) ප්‍රශ්න පත්‍ර ඇතුළුව (i) සිට (iv) දක්වා ඇති ප්‍රශ්න පත්‍රවලින් සාමාර්ථයක් ලබා තිබීම අවශ්‍ය වන අතර, තලමිතියට පමණක් පෙනී සිටින අයදුම්කරුවන් විසින් (iv) සහ (i) ප්‍රශ්නපත්‍ර ඇතුළුව (i) සිට (iii) දක්වා ඇති ප්‍රශ්න පත්‍රවලින් සාමාර්ථයක් ලබා තිබීම අවශ්‍ය වේ. එසේම බිම් මැනීම හා තලමිතිය යන කොටස් දෙකටම පෙනී සිටින අයදුම්කරුවන් විසින් (i) සහ (v) ප්‍රශ්න පත්‍ර ඇතුළුව (i) සිට (v) දක්වා ඇති සියළුම ප්‍රශ්න පත්‍ර වලින් සාමාර්ථයක් ලබා තිබීම අවශ්‍ය වේ.

8. ලිඛිත විභාගයෙන් සාමාර්ථයක් ලබන හෝ ලබා ඇති අයදුම්කරුවන් හට බිම් මැනීමේ හා තලමිතියේ විෂයය නිර්දේශයන් උඩ පිළියෙල කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටීම සඳහා එය පැවැත්වෙන දිනයන් හා වේලාවන් පිළිබඳවත්, එය පවත්වනු ලබන ස්ථානය පිළිබඳවත් යථා පරිදි දැනුම් දෙනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීම සඳහා විභාග පරීක්ෂකවරුන් සම්පූර්ණයෙන් සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයින්ට පවරනු ලබන ප්‍රායෝගික වැඩ කොටස නිම කළ යුතුය.

9. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටින සෑම අයදුම්කරුවෙකුම නියම කරනු ලබන දිනයන් හි දී විභාගයට පෙනී සිටීම අනිවාර්ය වේ. කිසිම හේතුවක් නිසා මෙම දිනයන් වෙනස් කරනු නොලැබේ.

අයදුම්කරුවන් විභාග පරීක්ෂකවරයා විසින් නියම කරන ලද වේලාවන් අතරතුර ක්ෂේත්‍රයේ වැඩ කළ යුතු අතර ඒ සඳහා යහපත් තත්ත්වයක ඇති උපකරණ ඉදිරිපත් කළ යුතුය. උපකරණවල ඇති දොස්, සදොස් වැඩ සම්බන්ධයෙන් සමාවට කාරණයක් සේ නොපිළිගැනේ, පරීක්ෂණ වේලාවන් තුළදී අයදුම්කරුවන් වෙනත් කිසිවෙකුත් සමඟ කථා නොකළ යුතුය. එසේ කරන අයදුම්කරුවන් විභාගයට නුසුදුස්සන් සේ සළකනු ලැබේ.

10. සෑම අයදුම්කරුවකු විසින්ම මැනුම් උපකරණ, මැනුම් රීටි, ලඹ, කුඤ්ඤ, ඇඳීමේ පත්‍ර, ඇඳීමේ උපකරණ, අවශ්‍ය ලිපිද්‍රව්‍ය සහ කම්කරුවෝද ඇතුළුව අවශ්‍ය සියළු දෑ සපයා ගත යුතුය. ලිඛිත පරීක්ෂණයේ දී හෝ ප්‍රායෝගික පරීක්ෂණයේ දී අවශ්‍යතාවයන් සපයාදීම සම්බන්ධයෙන් කුමන විධියේ හෝ ආධාරයක් අප විසින් දෙනු නොලැබේ.

11. *2006 මැයි 25 වැනි දිනට පසුව එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.*

12. සෑම අයදුම්කරුවක්ම, ලිඛිත විභාගයේ දී හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී විභාග අධීක්ෂකවරයා සෑහීමට පත් වන අයුරින් ස්වකීය අනන්‍යතාවය ඔප්පු කල යුතුය. ඒ සඳහා පහත සඳහන් ලිපි ලේඛණ වලින් එකක් ඉදිරිපත් කළ හැකි වේ :–

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක් ;

(ආ) වලංගු ගුවන් ගමන් බලපත්‍රයක් ;

(ඇ) මෙම විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට (3) වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්.

13. අවශ්‍ය පරිදි අනන්‍යතාවය ඔප්පු කිරීමට සාධක ඉදිරිපත් නොකරන කිසිම අයදුම්කරුවකුට මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. වරක් තැන්පත් කරනු ලැබූ විභාග ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවනු ලබන අතර, පසුව පැවැත්වෙන විභාග සඳහා එම ගාස්තු පාවිච්චි කිරීමට ද අවසර දෙනු නොලැබේ.

15. සියළුම ලියකියවිලි පෞද්ගලිකව මා නමට නොව "මිනින්දෝරු අධිකාරි, විභාග අංශය, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය, දියතලාව" යන ලිපිනයට යැවිය යුතුයි.

බී. ජේ. පී. මෙන්ඩිස්,
සර්වේයර් ජනරාල්.

2006 මාර්තු මස 02 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ.පෙ. 506,
කොළඹ 05.

04 – 241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.